ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

15th December 2020

Chairmen of;
Bank of Ceylon
People's Bank
National Savings Bank
Regional Development Bank
Director General of Pensions
Director General of Department of Samurdhi Development

**Supplementary Festival Credit Facility**

His Excellency the President has directed to provide a Supplementary Festival Credit Facility to all interested employees in the public and private sector as well as Samurdhi beneficiaries, self-employees etc, in appreciation of their deep compliance to the Covid -19 health related living style throughout this year while remaining firmly committed to overcome the challenges due to impact of Covid- 19 in 2020.

This Credit facility should be provided at 0.625 percent monthly interest, recoverable in 10 monthly instalments commencing from the month of January 2021. This credit facility will be provided as follows.

1. Employees having a take home monthly income of Rs. 50,000/- or more, is entitled for a credit facility of Rs. 50,000/-.
2. Employees having a take home monthly income above 25,000/- but less than Rs. 50,000/-, is entitled for a credit facility of Rs. 25,000/-.
3. Employees having a take home monthly income less than Rs. 25,000/-, is entitled for a credit facility of Rs. 10,000/-.

Heads of public and private sector establishments are requested to provide the certified list of employees who are willing to enjoy this facility to the Bank of Ceylon, People's Bank, National Savings Bank or Regional Development Bank depending on their choice. The bank will make necessary arrangements to credit this facility to respective employee accounts to enable them to use the facility during the festive season.

The Department of Pensions and the Department of Samurdhi Development shall provide their certified list to the above banks with the commitment to recover the same on the basis mentioned above. The above mentioned banks are requested to provide same facility for those who operate three wheelers, school vans and private buses etc, who have bank accounts with the respective banks.



Galle Face, Colombo 01
Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
Fax ++ 94 11 2446657
e-mail prsec@presidentsoffice.lk

His Excellency the President expects fullest cooperation on all public sector and private sector establishments to assist their employees to obtain this Supplementary Festival Credit Facility. Hence, all such establishments are requested to coordinate with above mentioned banks to implement this facility before 18th December 2020.

A brief note of the Loan Scheme is annexed.

P. B. Jayasundera
Secretary to the President

| | | |
|---|---|---|
| Copy: | Hon. Basil Rajapaksa | – Chairman, Presidential Task Force on Economic Revival and Poverty Eradication |
| | Mr. S. R. Attygalle | – Secretary to the Treasury |
| | Prof. W. D. Lakshman | – Governor of the Central Bank of Sri Lanka |
| | Mr. J. J. Rathnasiri | – Secretary to the Ministry of Public Services, Provincial Councils and Local Government |
| | Mr. H.K.D. Hapuhinna | – Secretary to the State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self-Employment and Business Development |
| | Mr. Lakshman Silva | – Chairman, Sri Lanka Banks' Association – You may request private banks to implement the same facility, if they desire to join this national endeavour |

# <u>පරිපූරක උත්සව ණය යෝජනා ක්‍රමය</u>

ලෝක කොවිඩ් වසංගත තත්ත්වය තුළ 2020 වර්ෂය අප රටේ ජනතාවට ඉමහත් අභියෝගයන් රැසකට මුහුණ දීමට සිදුවූ වසරක් විය. කොවිඩ් වසංගත නිරෝධායන සෞඛ්‍ය උපදෙස් තුළ, දැඩි ආත්ම විශ්වාසයකින් සිය දෛනික කටයුතු කිරීමෙන් රටක් ලෙස අභියෝග වලට මුහුණදීමේ හැකියාව අප රටේ ජනතාව තහවුරු කර ඇත.

එම නිසාම අපේ රටේ කෘෂිකාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයේ පුනර්ජීවණයකට 2020 වර්ෂය තුළ ප්‍රවේශ වීමට හැකිවූවා පමණක් නොව එම නිෂ්පාදන ප්‍රදේශ වලින් නාගරික ප්‍රදේශවල ජන ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය ආහාර සැපයුම තහවුරු කර ගැනීමට අප රටට හැකිවිය.

කොවිඩ් වසංගතය පාලනය සඳහා පැවති මාස 2ක පමණ සංචරණය සීමා කාලය (Lock Down) තුල ඇඟුම්, අපනයන, සංචාරක, ඉදිකිරීම් හා අනෙකුත් නිෂ්පාදන කටයුතු වසර මැද සිට යළි ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්කර ගැනීමටද අප රටේ වැඩකරන ජනතාව හා ව්‍යාපාර ප්‍රජාවද දැඩි කැපකිරීමකින් කටයුතු කිරීම තුළ කොවිඩ් වසංගතයේ අහිතකර බලපෑම් අඩුකර ගැනීමටද සමත්විය.

සෞඛ්‍ය, ආරක්ෂක, පොලිස්, රාජ්‍ය සේවා විසින් රෝග නිරෝධායන කටයුතුවලට මුල්තැන දී සිය රාජ්‍ය සේවා සැපයීම තුළ රටේ බොහෝ කටයුතු සාමාන්‍ය තත්ත්වයෙන් පවත්වා ගත හැකි විය.

මෙම ධනාත්මක ප්‍රතිචාරයන් තුළ රට ඉක්මනින් සාමාන්‍ය තත්ත්වයට පත් කර ගැනීමත්, ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවයන් වලට ක්‍රමයෙන් යොමු කර ගැනීමට දිරිගැන්වීමත් රජයේ වගකීමයි. එමගින් එළඹෙන 2021 වසර, 2020 වසරේ අහිමි වූ ප්‍රගතියද සමගින් රට ඉදිරියට ගෙන යා හැකි වර්ෂයක් කර ගැනීම රජයේ අරමුණ වී ඇත.

නත්තල් හා නව වසර උදාවත් සමඟ එළඹෙන උත්සව සමය වෙනුවෙන් ජනතාවගේ විවිධ අවශ්‍යතා සපුරා ගැනීමට සෑම පවුලක්ම ආවරණය වන පරිදි මසකට සියයට 0.625ක පොලියකට හා මාස 10කින් ගෙවීමට යටත්ව පරිපූරක මූල්‍ය පහසුකම් ලබාදීම මින් එක් දිරිගැන්වීමක්.

එම ණය මුදල පහත කාණ්ඩ තුනෙන් සමන්විත වේ.

1. මසකට රු. 50,000/-කට වැඩි වැටුප් / ආදායම් ලබන්නන් සඳහා රු. 50,000ක ණය මුදලක්
2. මසකට රු. 25,000/-ත් 50,000ත් අතර වැටුප් / ආදායම් ලබන්නන් සඳහා රු. 25,000ක ණය මුදලක්
3. මසකට රු. 25,000/-කට අඩු වැටුප් / ආදායම් ලබන්නන් සඳහා රු. 10,000ක ණය මුදලක්

ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා සමෘද්ධි බැංකුව විසින් මෙම මුදල් දෙසැම්බර් මස 18 වන දිනට පෙර අදාල ඉල්ලුම්කරුවන්ගේ ගිණුම්වලට බැරකිරීමට කටයුතු කරනු ඇත.

රජයේ හෝ පෞද්ගලික සේවාවන්වල යෙදෙන සේවකයන්ට මෙම පරිපූරක සහන ණය ලබාගැනීමට පහසු කිරීම සඳහා එම ආයතනවල ප්‍රධානීන් සිය සේවකයන්ගේ සහතික කළ නාමලේඛණය තම සේවා ස්ථානය අසල පිහිටි රාජ්‍ය බැංකු වෙත ඉදිරිපත් කළ විට, අදාල බැංකු විසින් එම මුදල සේවකයින්ගේ ගිණුම් වලට බැර කරනු ලැබේ. සේවා ආයතන ප්‍රධානීන් විසින් 2021 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් 31 වන දින දක්වා මාස 10ක කාලය තුළ මෙම ණය මුදල සේවකයාගේ අදාල වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

රජයේ විශ්‍රාමලාභීන් සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවත්, සමෘද්ධිලාභීන් සඳහා සමෘද්ධි බැංකු විසිනුත් මෙම සහන ණය මුදල සපයනු ලබන අතර, ත්‍රීවිලර්, පාසැල් වෑන් හා බස්රථ හිමියන්, පෞද්ගලික බස්රථ සේවකයන් වැනි අය සඳහා, තමන්ගේ බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන රාජ්‍ය බැංකුව වෙත තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර මෙම සහන ණය මුදල සඳහා ඉල්ලුම් කළ හැකිය. මෙම ගනයට අයත් නොවන රාජ්‍ය බැංකුවල ගිණුම් පවත්වාගෙන යනු ලබන දෛනික රැකියාවල යෙදෙන්නන් සඳහාද මෙම මූල්‍ය පහසුකම ලබා ගැනීම සඳහා අදාළ රාජ්‍ය බැංකුවෙන් ඉල්ලුම් කළ හැකිය.